**ශීර්ෂය 227 - පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 227 - පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 නොවැම්බර් 18 දින කොමසාරිස් ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

---

**මූළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 674.58 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 667.80 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 6.78 ක් හෙවත් සියයට 1.01 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 571.24 | 566.93 | 4.31 | 0.75 |
| මූලධන | 103.34 | 100.87 | 2.47 | 2.39 |
| **එකතුව** | **674.58** | **667.80** | **6.78** | **1.01** |

## 2.2 ආදායම් ගිණුම

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේත 20.03.02.03 සඳහා එකතුව රු.මිලියන 140 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 172 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 22.93 කින් වැඩි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.03.02.03 | 140.00 | 172.10 | 32.10 | 22.93 |

## 2.3 අත්තිකාරම් ගිණුම

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

#### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 22701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 23.43 | 22.08 | 16.00 | 18.86 | 65.00 | 47.54 |

## 2.4 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0033/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 2.89 ක් විය.

**2.5 පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 6.38 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0055/000 | 2.72 |
| 6000/0000/00/0002/0073/000 | 0.12 |
| 6000/0000/00/0016/0023/000 | 3.51 |
| 6000/0000/00/0018/0030/000 | 0.03 |
| **එකතුව** | **6.38** |

**2.6 විගණන නිරීක්ෂණය**

දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි.

**3.2 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අග්‍රිමයන් දෙපාර්තමේන්තුව වෙත ප්‍රමාණවත් පරිදි නිකුත් නොකිරිම නිසා වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 12 ක සිට සියයට 88 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකිවීම නිසා එම ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 3.3 ආදායම් ගිණුම

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් අංක 20.03.02.03 දරන ආදායම් සංකේතයට අදාළ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස් කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරය පැවරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට ආදාළව රු.මිලියන 140 ක ආදායමක් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 172 ක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායම සියයට 23 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා රැස් කරන ලද ශුද්ධ ආදායම රු. මිලියන 172.10 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ රැස්කළ ආදායමට සාපේක්ෂව රු. මිලියන 69.64 ක් හෙවත් සියයට 68 කින් වැඩි වී තිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 22701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.644,054 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 11 ක් දක්වා වූ කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

### වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනය ප්‍රකාරව 2015 වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණය සිදු කර තිබුණි. එම සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව අතිරික්ත, ඌනතා හා නිර්දේශ යන් සම්බන්ධයෙන් 2016 අප්‍රේල් 30 දින වන විටත් එම චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

එමෙන්ම ඉහත චක්‍රලේඛයේ 3.5 ඡේදය ප්‍රකාරව 2017 පෙබරවාරි 26 දිනට පෙර සමීක්ෂණ වාර්තාවේ සඳහන් විනාශ කළ යුතු භාණ්ඩ, අළුත්වැඩියා කළ යුතු භාණ්ඩ හා වෙන්දේසි කළ යුතු භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කර අවසන් කළ යුතු වුවත්, 2017 අප්‍රේල් 30 දින වන විටත් එම කටයුතු සිදු කර නොතිබුණි.

## 3.6 අනුකූල නොවීම්

### නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | |
| (i) 5.4.10 මාර්ගෝපදේශය | 4,425,000 | ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා කොන්ත්‍රාත් මුදලින් සියයට 10 ක වටිනාකමට සමාන කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු වුවත්, පරිගණක 50 ක් මිලදී ගැනීම සඳහා කරන ලද ප්‍රසම්පාදන අවස්ථා 02 කදී අදාළ කාර්යසාධන සුරක්ෂණ ලබා ගෙන නොතිබුණි. |
| (ii) 6:3:3(අ) මාර්ගෝපදේශය | 1,430,000 | ADF ස්කෑන් යන්ත්‍ර (පරිලෝකන යන්ත්‍ර) මිලදී ගැනීමට අදාල ප්‍රසම්පාදන කාර්යයේදී මිල ගණන් විවෘත කිරීමේ කමිටුවක් පත්කර නොතිබුණි. |
| (iii) 6:3:6 මාර්ගෝපදේශය | 1,430,000 | දෙපාර්තමේන්තුවේ එක් දින සේවා අංශය සඳහා අවශ්‍ය ඩොට් ප්‍රින්ටස්, රිබන් සහ ADF ස්කෑන් යන්ත්‍ර (පරිලෝකන යන්ත්‍ර) මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කාර්යයට අදාළව ලංසු විවෘත කිරීමේ ආකෘති පත්‍ර හා වාර්තා සටහන්වල කිසිදු සාමාජිකයෙකුගේ නමක් හෝ අත්සනක් හෝ තබා නොතිබුණි. |

## 3.7 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේ ආරම්භ කර තිබූ විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය 2009 වර්ෂයේ අවලංගු කර තිබූ අතර නැවත එම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම සඳහා 2011 අගෝස්තු 17 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එහි මුල් ඇස්තමේන්තු ගත වියදම රු. මිලියන 14,500 ක් වී තිබුණි. පසුව එය රු. මිලියන 8,000 ක් දක්වා අඩු කිරීමට පියවර ගෙන තිබුණි. 2015 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 755.82 ක් වැය කර තිබුණි. පුරවැසි දත්ත ඇතුළත් අයදුම්පත් පරිලෝකනය කර දත්ත විද්‍යුත්කරණය කිරීම සහ රැස්කරගත් දත්ත බෙදාහැරීම පිළිබඳ සේවාවන් අදියර I යටතේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට 2013 ඔක්තෝබර් 31 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි.

2014 ජූලි 10 දින පුරවැසි දත්ත රැස් කිරීමට ජනාධිපති මෙහෙයුම් කමිටුවේ අනුමැතිය ලද පසු දකුණු පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 27 ක 2014 සැප්තැම්බර් මාසයේදී මූලික දත්ත රැස් කිරීමේ නියමු පියවර ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතියේ දත්ත රැස්කිරීම සඳහා අයදුම්පත් 491,975 නිකුත් කර තිබුණද, ඉන් 2016 අගෝස්තු 31 දින වන විට අයදුම්පත් 275,000 ක් එනම් නිකුත් කළ අයදුම්පත් සංඛ්‍යාවෙන් සියයට 55.8 ක අයදුම්පත් ආපසු ලැබී තිබුණි. දකුණු පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6 කින් ලැබී තිබුණු තොරතුරු පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| **ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | **අවුරුදු 15ට වැඩි ජනගහනය** | **දත්ත රැස් කර තිබූ සංඛ්‍යාව** | **අවුරුදු 15ට වැඩි සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|
| කඩවත්සතර | 84,200 | 528 | 0.63 |
| ඉමදූව | 34,323 | 1,999 | 5.82 |
| කරන්දෙනිය | 47,770 | 22,272 | 46.62 |
| ගෝනාපීනුවල | 18,188 | 1,120 | 6.16 |
| මාලිම්බඩ | 29,068 | 1,392 | 4.79 |
| කිරින්ද පුහුල්වැල්ල | 16,560 | 5,055 | 30.53 |

ඉහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දත්ත රැස්කර තිබුණු ප්‍රමාණය ඉතා අඩු මට්ටමක පැවතුණි.

(ii) දිවයිනේ සියළු පළාත් නියෝජනය වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 වෙනුවෙන් සම්පූර්ණ කරන ලද දත්ත ඇතුළත් අයදුම්පත් තැපැල් මඟින් ගෙන්වා ගැනීමට රු.94,000,000 ක් වෙන්කර තිබුණ ද, අදාළ නියමු වැඩසටහන දකුණු පළාතේ පමණක් ක්‍රියාත්මක කිරීම මත ඇස්තමේන්තුගත වටිනාකමෙන් 2015 දෙසැම්බර් 31 දින වන විට රු.1,086,540 ක් හෙවත් ප්‍රතිපාදනයෙන් සියයට 1.1 ක් පමණක් වැය කර තිබුණි.

(iii) 2007 වර්ෂයේදී ආරම්භ කර තිබූ විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතේ විද්‍යුත් දත්ත රැස් කිරීමට හා පනතට අදාළ අනෙක් සංශෝධන සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම ප්‍රමාදවීම හේතුවෙන් ව්‍යාපෘති කටයුතු 2016 අගෝස්තු 31 වන විටත් මන්දගාමීව පැවතුණි. මේ සම්බන්ධයෙන් නීතිපති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබා ගෙන එය අමාත්‍ය මණ්ඩලයේ හා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට සැලැසුම් කර ඇති බව කොමසාරිස් ජනරාල්වරයා විසින් විගණනයට දන්වා තිබුණි.

(ආ) හැඳුනුම්පත් මුද්‍රණය කිරීම සඳහා පෞද්ගලික සමාගමකට කොන්ත්‍රාත්තුව ලබා දී මුද්‍රණ කටයුතු සිදු කර තිබුණි. භාවිතා කරන කාඩ්පත්වලින් සියයට 10 කට වඩා වැඩි ප්‍රතිශතයක් අපතේ යන අතර, 2015 වර්ෂයේදී මුද්‍රණය කල කාඩ්පත් 717,941 කින් කාඩ්පත් 88,347 ක් එනම් සියයට 12 ක් අපතේ ගොස් තිබුණි.

## 3.8 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 25 | 24 | 1 |
| (ii) | තෘතියික මට්ටම | 4 | 2 | 2 |
| (iii) | ද්විතියික මට්ටම | 1,195 | 1,027 | 168 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 142 | 127 | 15 |
| | **එකතුව** | **1,366** | **1,180** | **186** |